# ගිණුම්කරණය

## අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සඳහා විෂයානුබද්ධ සංචිතය

## 10

## හවුල් ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි - බහුවරණ ප්‍රශ්න

01) නිවැරදි පිළිතුර තෝරන්න.
හවුල් ව්‍යාපාරයක උපරිම සාමාජික සංඛ්‍යාව 20 ක් බවට සීමා කර ඇත්තේ,
(1) 1890 හවුල් ආඥා පනත මඟිනි.
(2) 2007 අංක 7 දරන සමාගම් පනත මඟිනි.
(3) 1840 අංක 7 දරන වංචා වැලැක්වීමේ ආඥා පනත මඟිනි.
(4) 1918 අංක 6 දරන ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ පනත මඟිනි.
(5) එම හවුල් ව්‍යාපාරයේ හවුල් ගිවිසුම මඟිනි.

02) පහත ප්‍රකාශ අතුරින් හවුල් ව්‍යාපාර ආඥා පනතේ 24 වන වගන්තිය අනුව අසත්‍ය ප්‍රකාශය වනුයේ,
(1) හවුල්කරුවන් විසින් ප්‍රාග්ධනයට අමතරව ව්‍යාපාරයට සැපයූ ණය සඳහා 5%ක පොලියක් හිමි වේ.
(2) පාලන කටයුතු සිදු කිරීම වෙනුවෙන් හවුල්කරුවන් සඳහා වේතන හිමි නොවේ.
(3) හවුල්කරුවන් විසින් ව්‍යාපාරයට යෙදවූ ප්‍රාග්ධනය සඳහා ප්‍රාග්ධන පොලී හිමි වේ.
(4) ව්‍යාපාරයේ වියදමක් හවුල්කරුවකු විසින් පුද්ගලිකව දරා ඇති විට එය ප්‍රතිපූරණය කළ හැකිය.
(5) හවුල් ව්‍යාපාරයේ ලාභ අලාභ හවුල්කරුවන් විසින් සමව බෙදා ගත යුතුය.

03) විසල් හා නිසල් හවුල් ව්‍යාපාරයක් පවත්වා ගෙන යනු ලබන අතර ලාභ අලාභ 5:3 අනුපාතයට බෙදා ගනී. ඔවුන්ගේ ප්‍රාග්ධන හා ජංගම ගිණුම් ශේෂ 2021.04.01 දිනට පහත පරිදි වේ.

| විස්තරය | විසල් (රු'000) | නිසල් (රු'000) |
|---|---|---|
| ප්‍රාග්ධන ගිණුම් | 500 | 300 |
| ජංගම ගිණුම් | 50 | 80 |

සියලු හවුල්කරුවන්ට 10% ක ප්‍රාග්ධන පොළී හා රු.30,000ක මාසික වේතනයක් හිමි වේ. වාර්තා කරන ලද හවුල්කරුවන්ගේ ගැනිලි විසල් රු.20,000ක් හා නිසල් රු.30,000ක් වේ.

2022/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජනයන්ට පෙර ලාභය රු.2,800,000 ක් වේ.

2022/03/31 දිනට විසල්ගේ හා නිසල්ගේ ජංගම ගිණුම් ශේෂ වනුයේ, (රු. 000)

(1) විසල් - 1,380, නිසල් - 890
(2) විසල් - 1,730, නිසල් - 1,250
(3) විසල් - 1,710, නිසල් - 1,220
(4) විසල් - 1,690, නිසල් - 1,190
(5) විසල් - 1,250, නිසල් - 750

ප්‍රශ්න අංක 4,5,6 සඳහා පහත තොරතුරු භාවිතා කරන්න.

අනුර, රෝහණ සහ වෙනුර හවුල් ව්‍යාපාරයේ 2022/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ජංගම ගිණුම පහත දැක්වේ.

රු'000

| විස්තරය | අනුර | රෝහණ | වෙනුර | විස්තරය | අනුර | රෝහණ | වෙනුර |
|---|---|---|---|---|---|---|---|
| ශේෂය ඉ/ගෙ | | | 10 | ශේෂය ඉ/ගෙ | 20 | 40 | |
| ගැනිලි | 100 | 150 | 90 | ප්‍රාග්ධන පොලී | 40 | 60 | 40 |
| | | | | වේතන | 480 | 480 | 480 |
| ශේෂය ප/ගෙ | 700 | 586 | 472 | ලාභ කොටස් | 260 | 156 | 52 |
| | 800 | 736 | 572 | | 800 | 736 | 572 |
| | | | | ශේෂය ඉ/ගෙ | 700 | 586 | 472 |

අමතර තොරතුරු

හවුල් ව්‍යාපාරයේ ලාභය ගණනය කිරීමේදී අනුර සහ රෝහණ විසින් ලබා ගන්නා ලද රු.20,000ක හා රු.40,000ක භාණ්ඩ ගැනිලි වාර්තා වී නැත.
හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන පොලී 10% කි.

4) හවුල් ව්‍යාපාරයේ නිවැරදි ලාභය ගණනය කරන්න.

5) හවුල් ව්‍යාපාරයේ මුලු හිමිකම ගණනය කරන්න.

6) 2022/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අනුරගේ මුලු ඉපයීම කීයද?

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන සොබාව